විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් හැඳින්වීම සඳහා අප සමාජය භාවිත කරන යෙදුම් තිබේ.

එවැනි ඇතැම් යෙදුම් නිසා යම් පුද්ගලයෙකු ප්‍රජාවක් අවමානයට ලක් වන අවස්ථා දුලභ නොවේ.

වෙනස් ලෙස සැලකීම හෝ පහත හෙළීමේ ආකල්ප සමග එම යෙදුම් බද්ධව පවතී.

එබැවින් එම යෙදුම් නවීන සමාජයට කෙතරම් උචිත ද යන ගැටළුව මතුවේ.

උදාහරණයක් ලෙස උස යාම සහ වර්ධනය සීමා වුණු පුද්ගලයන් නැතිනම් 'dwarfism' තත්වය සහිත පුද්ගලයන් සිංහල මාධ්‍ය තුළ හැඳින්විය හැකි ආකාරය නිරීක්ෂණය කිරීම වටී.

'Dwarfism' සඳහා සිංහල භාෂාවේ ඇති යෙදුම් අතර "මිටි" හෝ "කුරු" බව යන යෙදුම් තිබුණත්, එම යෙදුම් කෙතරම් යෝග්‍ය ද යන්න පාඨකයන් ලෙස අප සිතා බැලිය යුතුය.

සති අග අරුණ (ඔක්තෝබර් 23, 2022), "මිටි මිනිස්සු, මිටි මිනිස්සු මොරටුවේදී මුණ ගැසෙති" යන සිරස්තලයෙන් පළ වූ පුවත් වාර්තාව වෙත අවධානය යොමු කරමු.

ලොව ශිෂ්ට සම්පන්න සමාජ හෝ ජාත්‍යන්තර මාධ්‍ය ආයතන "dwarf" හෝ "dwarves" යන අවමන් සහගත යයි පිළිගැනෙන යෙදුම් වෙනුවට "උස යාම සහ වර්ධනය සීමා වුණු (restricted growth) හෝ වෛද්‍ය විද්‍යාත්මකව එම සෞඛ්‍ය තත්වය හඳුන්වන "dwarfism" යන යෙදුම භාවිත කරනු දැකිය හැක.

"Dwarfism" හැඳින්වීම සඳහා සිංහල භාෂාවෙන් අදට ගැලපෙන තනි යෙදුමක් සොයා ගැනීම තරමක අභියෝගයක් බැවින් එය විස්තර කර හැඳින්වීම වඩාත් ප්‍රායෝගික විය හැක.

උදාහරණයක් ලෙස, උස යාම සහ වර්ධනය සීමා වූ පුද්ගලයන් (someone who has dwarfism) ලෙස එම තත්වය විස්තර කළ හැක.

එසේම උස යාම සහ වර්ධනය සීමා වුණු පුද්ගලයන් මෙන්ම ඔවුන්ගේ පවුල්වලට අවශ්‍ය සහාය, සම්පත් සහ තොරතුරු ලබා දෙනුවස් ඔවුන් විසින් පිහිටුවා ගනු ලැබූ සංවිධාන ලොව පුරා දැකිය හැක.

'Little People of America' සහ 'Little People of Canada' ඒ අතර වේ.

සති අග අරුණ පුවත් වාර්තාවේ ද දැක්වෙන ආකාරයට, "Little People Association" යන්න

"කුඩා මිනිසුන්ගේ සංවිධානය" ලෙසින් සිංහලට පරිවර්තනය කර ඇත.

කෙසේ වුවත් නමක් සිංහලට පරිවර්තනය කිරීමේදී ඉංග්‍රීසි භාෂාවෙන්ම හැඳින්වීම (ලිට්ල් පීපල් ඇසෝසියේෂන්) හෝ එය පරිවර්තනය කිරීමේදී අවමානයක් සිදු නොවන අයුරින් සිංහල භාෂාවෙන් විස්තර කර දැක්වීම මෙවැනි සන්ධර්භයක් තුළ වඩාත් උචිත නොවේද?

උදාහරණයක් ලෙස: උස යාම සහ වර්ධනය සීමා වූ පුද්ගලයන්ගෙන් සැදුම්ලත් සංවිධානයක් වන "Little People Association"

ඒ අනුව,

1) සති අග අරුණ පුවත් සිරස්තලයේ සඳහන් "මිටි මිනිස්සු" යන යෙදුම ගැටළුකාරී යැයි ඔබ සිතන්නේ ද?
2) එසේත් නැතිනම්, ඒ සඳහා වෙනත් යෝග්‍ය යෙදුමක් ඔබට යෝජනා කළ හැකි ද?

මූලාශ්‍ර:

http://understandingdwarfism.com/correct-terminology
https://www.washington.edu/.../how-are-terms-dwarf-little...
https://www.respectability.org/.../little-people-dwarfism/

**අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ඔබගේ දුරකථනයටම ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා දැන්ම Ethics Eye subscriber කෙනෙක් වන්න!